සඳහා ආරූඪ නාමයක් භාවිත කැරුණේ නම්, කර්තෘගෙන් ලබාගත් උපකාරක ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම අවශ්‍යයි. තීරු ලිපිවල අන්තර්ගතයේ ඒකාබද්ධතාව තිබිය යුතු අතර ලිපියක දිග තීරුවකට හෝ දෙකකට සීමා විය යුතුය. සම්පූර්ණ පිටුවක් නොවිය යුතුය.

## සමාජ ප්‍රශ්න වාර්තාකරණය සඳහා පිරිනැමෙන සුබ්‍රමනියම් චෙට්ටියාර් සම්මානය

1930 දී වීරකේසරි පත්‍රය ආරම්භ කළ, කම්කරු අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටි සුබ්‍රමනියම් චෙට්ටියාර්ට උපහාර පිණිස මෙම සම්මානය පිරිනැමෙයි. සාධාරණව හා ආචාර ධර්මානුකූල ප්‍රතිපත්තියක් අනුව නිරන්තරයෙන් සමාජ ප්‍රශ්න උභා දැක්වූ, හඬක් නැති ජනතාව වෙනුවෙන් හඬක් නැඟීමට උත්සාහ කළ, මාධ්‍ය ඔස්සේ සමාජ ප්‍රශ්නවලට විසඳුම් සෙවීමට ක්‍රියාත්මක වූ වාර්තාකරුවකුට මෙම සම්මානය පිරිනැමෙයි. ඉදිරිපත් කැරෙන වාර්තා හුදෙක් තොරතුරක් වාර්තා කිරීමට පමණක් සීමා නොවිය යුතු අතර යුක්තිය ඉෂ්ට වන තෙක්ම ක්‍රියාත්මක වූවක් විය යුතුය. ලිපි, සමාජ ප්‍රශ්න වෙතම යොමු වී තිබිය යුතුය.

## වසරේ විශේෂාංග ලේඛකයාට පිරිනැමෙන උපාලි විජේවර්ධන සම්මානය

සීමා සහිත උපාලි පුවත්පත් සමාගමේ ආරම්භක අභාවප්‍රාප්ත උපාලි විජේවර්ධනට උපහාර වශයෙන් පිරිනැමෙයි. ප්‍රස්තුත වන ප්‍රශ්න හෝ විෂයවල හරය ග්‍රහණය කරගත් පාඨකයාට ඒ පිළිබඳ වඩා හොඳ අවබෝධයක් දෙන විවිධත්වයෙන් යුත් ලිපි (අවම වශයෙන් ඉදිරිපත් කැරෙන හයක් (6) සමුච්චයක් මෙම සම්මානයෙන් අගයෙයි. එම ලිපි සාධාරණ හා නිවැරැදි විය යුතුවාක් මෙන්ම හොඳම පුවත්පත් කලාවේදී ප්‍රතිපත්තිවලින් බැඳුණු ලේඛන ද විය යුතුය.

මෙම ශ්‍රේණියේදී ලිපිවල තත්ත්වය හා භාෂාව ප්‍රමුඛස්ථානයෙහි ලා සැලැකෙයි. තම ප්‍රවෘත්ති විශේෂාංග රචනාවලින් හෝ විශේෂාංග රචනාවලින් හා/හෝ ප්‍රබල ආකර්ෂණීය ශෛලියක් ප්‍රකට කරන පුවත්පත් කලාවේදීහු විනිශ්චය මණ්ඩලයේ අවධානයට ලක් වෙති. එම ලිපි මානව රුචිය වඩවන ලේඛනවල සිට සංචාරක වාර්තා දක්වා විවිධ විය හැකි අතර අවශ්‍යයෙන්ම කරුණු පාදක කොට ගත් ලිපිම වීම අවශ්‍ය නොවේ. සම්මුඛ සාකච්ඡා මෙම ශ්‍රේණියට ඇතුළත් නොවේ.

## ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ නාම යෝජනා අනුව පිරිනමන විශේෂ සම්මාන

- සමානයන්ගේ හා පොදු ජනතාවගේ අගැයීමට ලක්වීම වෙනුවෙන් පිරිනැමෙන ඩී.ආර්.විජේවර්ධන සම්මානය.
- ශ්‍රී ලංකාවේ පුවත්පත් නිදහස ආරක්ෂා කිරීම වෙනුවෙන් පිරිනැමෙන සේපාල ගුණසේන සම්මානය.
- දීර්ඝ කාලීන විශිෂ්ට සේවා සම්මානය.



# රීති හා රෙගුලාසි

## 17 වැනි සංස්කරණය

## පුවත්පත් කලාවේදී විශිෂ්ටතා සම්මාන 2015



ශ්‍රී ලංකා කර්තෘ සංසදය 1999 සිට වාර්ෂික පුවත්පත් කලාවේදී විශිෂ්ටතා සම්මාන ප්‍රදානෝත්සවය පවත්වාගෙන එයි. 2003 දී පිහිටුවන ලද ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය ද පුවත්පත් කලාවේ වෘත්තීය විශිෂ්ටතාවේ වැඩි වර්ධනය පිළිබඳ පොදු අරමුණ ප්‍රදර්ශනය කරමින් හා නිශ්චිත කාලයක් තුළ පුවත්පත් කාලවෙහි විශිෂ්ටත්වයට පත් වන්නන්ට සම්මාන ප්‍රදානය කිරීමෙන්ද එම කාර්යයේ හවුල්කාරයකු බවට පත් වූයේය.

## පුවත්පත් කලාවේදී විශිෂ්ටතා සම්මාන ප්‍රදානයේ අරමුණු කවරේද ?

මෙය වෘත්තීය සම්මානයන් විසින් හොඳ පුවත්පත් කලාව හඳුනා ගැනීම හා එය උත්සවාකාරයෙන් සැමරීමත් සඳහා වන විශිෂ්ටතම වාර්ෂික පුවත්පත් කලාවේදී සම්මාන ප්‍රදානෝත්සවයයි. එමෙන්ම මෙය පුවත්පත් කලාව වෙනුවෙන් දැක්වෙන ධෛර්යය, කැපවීම හා විශිෂ්ටත්වය අගැයීමත් ඒ වෙනුවෙන් ප්‍රතිලාභ ප්‍රදානයත් වෘත්තීය වෙනුවෙන් පිරිනැමුණු යාවජීව දායකත්වයට හා සේවයට ගෞරව දැක්වීමක් පිළිබඳ කාර්යයකි.

## ඉල්ලුම් කළ හැක්කේ කාටද ?

පුවත්පත් කලාවේදී විශිෂ්ටතා සම්මාන වැඩ පිළිවෙළේ අරමුණ අනුව ශ්‍රී ලංකාවෙහි පළ කැරෙන පුවත්පත්හි පළ කරනු පිණිස ලිපි හා ප්‍රවෘත්ති වාර්තා ලියන ඕනෑම ශ්‍රී ලාංකික පුවත්පත් කලාවේදියකුට මේ සඳහා අයැදුම්පත් ඉදිරිපත් කළ හැක්කේය. ඔහු හෝ ඇය, පුවත්පත් කලාවෙහි පූර්ණ කාලීනව නියුක්තව සිටින්නකු හෝ සිටින්නියක හෝ පුවත්පත්හි පළ වීම සඳහා ලිපි හා ප්‍රවෘත්ති වාර්තා ලියූ තැනැත්තකු, තැනැත්තියක හෝ විය යුතු අතර නියමිත කාලය තුළ ඔහුගේ හෝ ඇගේ ලිපි/ප්‍රවෘත්ති වාර්තා අවම වශයෙන් 10ක් වත් පළ වී තිබිය යුතුය.

පුවත්පත් කලාව පිළිබඳ ශිෂ්‍යයකු හෝ ආධුනියකු වශයෙන් කෙනකු විසින් පළ කරන ලද ලිපි/ප්‍රවෘත්ති වාර්තා ද සලකා බලනු ලැබේ.

## පුවත්පත් පිළිබඳ නිර්වචනය

පුවත්පත කුඩා (ටැබ්ලොයිඩ්) හෝ ලොකු (බ්‍රෝඩ්ෂීට්) ඕනෑම ප්‍රමාණයක විය හැකි අතර සම්මාන සඳහා අයැදුම් කරන අවස්ථාවේ එය පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවෙහි ලියා පදිංචි වී තිබිය යුතුය. එය දිනපතා හෝ සතිපතා හෝ ප්‍රකාශයට පත්විය යුතුය. එය වෙනත් පුවත්පතක අභ්‍යන්තර කොටසක් නොවිය යුතු අතර, එය වෙනම අලෙවි කැරෙන්නනක් විය යුතු යුතුය. අවම වශයෙන් මාස 12 ක කාලයක් තුළ පළ වන්නක් විය යුතුය.

### ප්‍රකාශන කාලය

ලිපි/ප්‍රවෘත්ති වාර්තා 2015 ජනවාරි 01 වැනිදාත් 2015 දෙසැම්බර් 31 වැනිදාත් අතර කාලය තුළ පළ වී තිබිය යුතුය.

### අයැදුම් කරන්නේ කෙසේ ද ?

අයැදුම් පත්‍ර හා නාම යෝජනා මෙම ලිපිනයට එවිය යුතුය.

### කැඳවුම්කරු

පුවත්පත් කලාවේදී විශිෂ්ටතා සම්මාන ඒකාබද්ධ කමිටුව, ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය බාරේ, 96, බර්නාඩ් සොයිසා මාවත, (කිරුළ පාර), කොළඹ 05.

### අයැදුම්පත් බාරගන්නා අවසාන දිනය

2016 අප්‍රේල් 20.





ලැබේ. ප්‍රවෘත්ති හා විශේෂාංග වාර්තාකරණයට අදාළ සම්පූර්ණ කෘති ඉදිරිපත් කළ යුතුය. ප්‍රශ්නෝත්තර වශයෙන් ඇති සම්මුඛ සාකච්ඡා බාර නොගැනේ.

## වසරේ පරිසර වාර්තාකරු

අදාළ වසර තුළ දී පරිසරය කෙරෙහි අවධානය යොමු කළ, පරිසර සංරක්ෂණය පිළිබඳ අවබෝධය වර්ධනය කළ හා පරිසර විනාශය අනාවරණය කළ හා/හෝ තොරතුරු සමුච්චයක් ඉදිරිපත් කරන පුවත්පත් කලාවේදියාට හෝ කණ්ඩායමට මෙය හිමිවෙයි. විනිශ්චය මණ්ඩලය දීර්ඝ කාලීන විමර්ශනය ප්‍රචාරය හෝ තොරතුරු වාර්තාකරණය බලාපොරොත්තු වන නමුත් අදාළ බලධාරීන් ක්‍රියාත්මක කරවන අන්දමේ ප්‍රබල හා නියත බලපෑමක් සමාජය වෙත එල්ල කරන පරිදි එක් වරකදී ලියැවුණු කතා ද සැලකිල්ලට භාජන කරනු ලැබේ. එක් එක් අයැදුම්පත සඳහා උපකාරක ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය. පුවත්පත් කලාවේදීහු කණ්ඩායමක් අයදුම් කරන්නේ නම් කර්තෘගේ උපකාරක ප්‍රකාශයක් අවශ්‍යවේ. එක් එක් අයැදුම්පත සමඟ අවම වශයෙන් ලිපි හයක් (6) ඉදිරිපත් කළ හැක්කේය.

ඉදිරිපත් කැරෙන ලිපි හා වාර්තා පරිසරය ආරක්ෂා කිරීමේ වටිනාකම අගැයීමට පාඨකයා උනන්දු කරවන ගුණයෙන් යුක්ත විය යුතු අතරම මනා පර්යේෂණයක් අනුව සැකැසුණු ඒවා මෙන්ම අවශ්‍ය විද්‍යාත්මක පදනමෙන් යුත් ඒවා ද විය යුතුය.

## වසරේ විමර්ශනාත්මක පුවත්පත් කලාවේදියා

එකම කරුණ සම්බන්ධයෙන් ප්‍රබල විමර්ශනාත්මක ස්වභාවයයෙන් හා ජාතික වැදගත්කමකින් යුත්, සැඟවුණු ඇත්ත අනාවරණය කරන අන්දමේ වාර්තාවක් හෝ වාර්තා පළ කර ඇති පුවත්පත් කලාවේදියාට හෝ පුවත්පත් කලාවේදීන් කණ්ඩායමට මෙම සම්මානය හිමි වෙයි. එම වාර්තාව හෝ වාර්තා දරුණු අපරාධ, දේශපාලන දූෂණ හෝ සාමූහික වැරැදි පිළිබඳව විය හැකිය. වචන 250කට නොවැඩි උපකාරක ප්‍රකාශයක් අයැදුම් පත්‍ර(ය) සමඟ ඉදිරිපත් කරන්න. (පුවත්පත් කලාවේදීහු කණ්ඩායමක් අයැදුම් කරත් නම්, උපකාරක ප්‍රකාශය, කර්තෘගෙන් ලබා ගත්තක් විය යුතුය.) කරන ලද පර්යේෂණයත් විමර්ශනයේදී දක්වා ඇති වෘත්තීයභාවය මෙන්ම කරුණු අනාවරණය සමාජය හා/හෝ අධිකාරීන් කෙරෙහි පෑ බලයත් විනිශ්චය මණ්ඩලයේ සැලකිල්ලට භාජන වෙයි. කතාව අවශ්‍යයෙන්ම අනෙක් පත්තරවල කලින් පළ කැරුණක්ම නොවිය යුතුවාක් මෙන්ම අනුගාමික වාර්තාවක් විය හැකි නමුත් පොදු ජන උනන්දුව දැල්වූවක් මෙන්ම ජාතික වැදගත්කමින් යුක්ත වූවක් ද විය යුතුය.

## වසරේ තීරු ලිපි රචකායට පිරිනැමෙන බී.ඒ. සිරිවර්ධන සම්මානය (සිංහල, දෙමළ, ඉංග්‍රීසි)

කෘතහස්ත ලේඛකයකු හා කතුවරයකු වූ බී.ඒ. සිරිවර්ධනට උපහාර වශයෙන් පිරිනැමෙන මෙම සම්මානය සිය අදහස් එඩිතරව පළ කොට පාඨකයන්ගේ මත උද්දීපනය කළ හා ඔවුන් අතර සංවාදයට මං පෑදූ ලේඛකයාට හෝ ලේඛිකාවට හිමිවෙයි. මෙම තීරු ලිපි ලේඛකයාගේ/ලේඛිකාවගේ සැබෑ නමින්ම හෝ ආරූඪ නාමයකින් හෝ ලියනු ලැබිය හැකි නමුත්, එම නාමය තීරු ලිපියෙහි අඛණ්ඩව යෙදී තිබිය යුතුය. විනිශ්චය මණ්ඩලය, ලේඛකයාටම/ලේඛිකාවට විශේෂ වූ භාෂා ශෛලය අපේක්ෂා කරයි. වසර තුළ දී එවැනි තීරු ලිපි අවම වශයෙන් 12ක් පළ වී තිබිය යුතු අතර, අයැදුම් වශයෙන් ඉන් හයක් (6) ඉදිරිපත් කල යුතු වේ. තීරු ලිපි

භාෂා රටාවත් සිය පාඨක පිරිස පිළිබඳ නිරවුල් අවබෝධයක් වැඩි ලකුණුවලට හේතුවෙයි. සම්මුඛ සාකච්ඡා ප්‍රශ්නෝත්තර විලාසයෙන් නොවිය යුතුය. පුවත්පත් නිවේදන පදනම් කොට පළවුණු වාර්තා මේ සඳහා සුදුසුකම් නොලබයි.

## වසරේ පුවත්පත් කලාවේදියාට පිරිනැමෙන මර්වින් ද සිල්වා සම්මානය

ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ ප්‍රථම සභාපතිවරයාටත් සුප්‍රකට කර්තෘවරයකු තීරු ලිපි රචකයකු හා විදේශ වාර්තාකරුවකු වශයෙන් ඔහුගෙන් ඉටුවුණු සේවයටත් උපහාර වශයෙන් පිරිනැමෙන මෙම සම්මානය වසර තුළ දැක්වුණු විශිෂ්ටත්වයත් සේවා සංයුක්තතාව හා විශිෂ්ටතම පුවත්පත් කලාවේදී භාවිතයත් අගැයීමට ලක් කැරෙයි. එය සියලුම කර්තෘවරුනට ද විවෘතය. අයැදුම්කරුවන් සමස්ත දේශයට හා සමාජයට බෙහෙවින් වැදගත් වන පුළුල් පරාසයක කරුණු වාර්තා කර තිබිය යුතුයි ස්වකීය කාර්යයේ විශේෂත්වය පැහැදිලි කරන, වචන 250කට නොවැඩි ප්‍රකාශයක් අදාළ උපකාරක ලේඛන ද සමග එක් එක් අයැදුපත සමග ඉදිරිපත් කළ යුතුය.

ප්‍රවෘත්ති හා ප්‍රවෘත්ති විශේෂාංගවල පුළුල් පරාසයක් අනාවරණය කරන විශේෂාංග මෙම සම්මානය සඳහා අපේක්ෂා කැරෙයි.
මෙම වැදගත් සම්මානය දිනා ගැනීම සඳහා පුවත්පත් කලාවේදීන් මාධ්‍ය විෂය ධාරා කාර්යක්ෂමව හා නිර්මාණාත්මකව භාවිත කර තිබිය යුතුය. ඔහුට/ඇයට සාර ගර්භ කතාවලට හේතු පාදක වන විමර්ශනාත්මක මනසක් හා ගවේෂණාත්මක කාර්යක්ෂමතාවක් ද තිබිය යුතුය. සංවේදී සිද්ධිවලදී තර්ජන හෝ අභියෝග නොතකා, දිරිමත්ව හා වගකීමෙන් යුතුව කටයුතු කිරීම මෙම සම්මානය සඳහා වාසි දායකය.

## වසරේ හොඳම නිමාවෙන් යුත් පුවත්පත

පාඨක හිතකාමී ආකර්ෂණීය හා පොදු ජන අවධානය ඇදගන්නා හොඳම නිමාවෙන් යුත් පුවත්පත නිෂ්පාදනය කරන කණ්ඩායමට හෝ පුද්ගලයාට මෙම සම්මානය පිරිනැමෙයි. නිමාවෙන්ද පුවත්පතේ විවිධ කොටස් ඔස්සේ වාර්තා සම්පාදනයෙන් ද විශාලතම බල පෑමක් එල්ල කිරීමට සමත් වූ පුවත්පත විනිශ්චය මණ්ඩලයේ අවධානයට ලක් වනු ඇත. මුල් පුවත්පතේ පිටිපත් අවම වශයෙන් හයක් (6) අයැදුම්පත් සමග විය යුතුය. කොටස් සහිත සම්පූර්ණ පුවත්පත ඉදිරිපත් කළ යුතුය.

## වසරේ තරුණ මාධ්‍යවේදියාට පිරිනැමෙන ඩෙන්සිල් පීරිස් සම්මානය

ශ්‍රී ලංකාවෙන් බිහිව දෙස් විදෙස්හි පුළුල් අගැයීමට ලක් වූ විශිෂ්ටතම පුවත්පත් කලාවේදී ඩෙන්සිල් පීරිස්ට උපහාර පිණිස මෙම සම්මානය පිරිනැමෙයි. සිය කාර්යයෙන් පුවත්පත් කලාවේදී ප්‍රබල ශක්‍යතාවක් පෙන්නුම් කරන, සාධරණ හා නිරවද්‍ය වාර්තාකරණයෙන් අංග සම්පූර්ණ කාර්යභාරයක් ඉටු කොට ඇති හා හොඳම පුවත්පත් කලාවේදී භාවිතයෙන් බැඳී සිටින, වයස අවුරුදු 26ට අඩු පුවත්පත් කලාවේදියාට/වේදිනියට මෙම සම්මානය පිරිනැමෙයි. වසර තුළ වැඩිම බලපෑමක් ඇති කිරීමට සමත්වූ මාධ්‍යවේදියා විනිශ්චය මණ්ඩලයේ අවධානයට ලක්වනු ඇත.
මෙම සම්මානයේ ජයග්‍රාහකයාට විදේශයක පුවත්පත් කලාව හැදෑරීම සඳහා ශිෂ්‍යත්වයක්





## සියලු ශ්‍රේණි සඳහා ඇතුළත් වීමේ පොදු රීති

- අයැදුම්පත් පෝරමය පිටපත් තුනකින් පමණක් විය යුතුය.
- අයැදුම්කරුගේ නම මුඛ්‍යාක්ෂරයෙන් (Capital Letter) සඳහන් විය යුතුය.
- ඡායා පිටපත් ඉදිරිපත් කරන්නේ නම් ඒවා අත්සන් තබනු ලැබිය යුතු අතර කර්තෘගේ මුද්‍රාව එක් එක් ඡායා පිටපතෙහි තැබිය යුතුය.
- ප්‍රවේශන නිසි පරිදි බැඳ තිබිය යුතුය. නොබැඳි පත් ඉරු බාර නොගැනේ.
- ඉල්ලුම් කරනු ලබන ශ්‍රේණිය විශේෂයෙන් සඳහන් විය යුතුය. (අදාළ කොටුව සලකුණු කරන්න)
- ඉල්ලුම් කරන ශ්‍රේණිය සඳහා අවශ්‍ය ලිපි/ඡායාරූප ගණන වෙනත් ආකාරයකින් විශේෂයෙන් සඳහන් කර නැත්නම් අයැදුම් පත්‍රයට ඇමිණිය යුතුය.
- ඇතැම් ශ්‍රේණි සඳහා ඉදිරිපත් කළ යුතු ප්‍රකාශය අයැදුම්පතට ඇතුළත් විය යුතු අතර එය වචන 250කට වැඩි නොවිය යුතුය.
- කර්තෘවරුන්ගේ වෘත්තීය ක්‍රියාමාර්ග පිළිබඳ ආචාර ධර්ම පද්ධතියෙන් හා ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ රෙගුලාසිවලින් ද බැඳී සිටින අදාළ පුවත්පත් කලාවේදියාට හා පුවත්පතට සිය අනුමැතිය දෙන බව තහවුරු කරමින් කතුවරයා/කතුවරිය අයැදුම්පත්‍රයේ අදාළ ස්ථානයෙහි ඔහුගේ/ඇයගේ අත්සන යෙදිය යුතුය.
- අයැදුම් පත්‍රයෙහි සඳහන් නමට වෙනස් ආරූඪ නාමයක් භාවිත කරන යම් අයැදුම්කරුවෙක්/කාරියක් වේ නම් ඔහු/ඇය අයැදුම් පත්‍රයෙහි සඳහන් නමින් මෙන්ම ආරූඪ නාමයෙන් ද හැඳින්වෙන්නේ එකම තැනැත්තා/තැනැත්තිය බව සහතික කරනු පිණිස කර්තෘවරයාගෙන් ලබාගත් ලියුමක් අයැදුම්පත්‍රයට ඇමිණිය යුතුය.
- අයැදුම් පත්‍රය අත්සන් කරන්නට කලින් කර්තෘවරු එය ඉල්ලුම් කරන ලද ශ්‍රේණියට ගැළපෙන්නේ ද යන වග තහවුරු කර ගත යුත්තෝය.
- ශ්‍රේණියකට එක් අයැදුම්පතක් පමණක් ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද අයැදුම්පත් වෙනත් ශ්‍රේණියක් යටතේ සලකා බැලීමට ද විනිශ්චය මණ්ඩලය තීරණය කරනු ඇත.
- අයැදුම්කරු පුවත්පත් කීපයක් වෙනුවෙන් වැඩ කරන්නේ නම් අයැදුම්පත අදාළ කතුවරයාගේ පුවත්පතට සම්බන්ධ බවට එම කතුවරයා සහතික විය යුතුය.
- ලිපිය හෝ ප්‍රවෘත්ති වාර්තා හෝ මුල්වරට පළ වීමෙන් අනතුරුව කරුණු නිවැරැදි කරන්නට හෝ කරුණු පැහැදිලි කරන්නට හෝ පළ වුණු කරුණු ඉල්ලා අස් කරගන්නට හෝ සිදු වූයේ නම් ඒවාද අයැදුම්පත්‍රයේ කොටසක් වශයෙන් ඉදිරිපත් කළ යුතුය. ලිපියට හෝ ප්‍රවෘත්ති වාර්තාවලට හෝ එල්ල වුණු ලිඛිත අභියෝගවල පිටපත් ද, මාධ්‍ය ආයතන ඒවාට දැක් වූ ප්‍රතිචාරද ඇතුළුව අයැදුම්පත්‍රයට ඇමිණිය යුතුය.
- අවශ්‍යතාව ඇති වුවහොත් විනිශ්චය මණ්ඩලය අයැදුම්කරුවන් සම්මුඛ සාකච්ඡා සඳහා කැඳවනු ඇත.
- කුමන ආකාරයක හෝ පෙළෙඹවීම්, ප්‍රචාරණ හා තර්ජනවල ප්‍රතිඵලය වනුයේ නුසුදුසු බවට පත්වීමය.

## ශ්‍රේණි

### වසරේ ඡායාරූප මාධ්‍යවේදී

වසර තුළ හොඳම ප්‍රවෘත්ති ඡායාරූප හෝ විශේෂාංග ඡායාරූප හෝ සිය කැමරාවට හසු කරගෙන තාක්ෂණික වශයෙන් ඉතා උසස් හා පැහැදිලි ඡායාරූප ඉදිරිපත් කරන ඡායාරූප මාධ්‍යවේදියාට මෙම සම්මානය පිරිනැමේ. වසර පුරා ඡායාරූප මාධ්‍යවේදියකු විසින් ගන්නා ලද අතිශයෙන්ම චිත්තාකර්ෂණීය ප්‍රවෘත්ති හා/හෝ විශේෂාංග/ඡායා රූප කෙරෙහි විනිශ්චය මණ්ඩලයේ සැලකිල්ල යොමු කැරෙනු ඇත. අත්‍යවශ්‍ය කොටස් අන්තර්ගත වන සේ කාරණයට අදාළ ඡායාරූපය ගැනීමේ හැකියාව ද ඇතුළු සමස්ත ශිල්පීය නිපුණතාව හා තාක්ෂණ නිපුණතාව කෙරෙහි ද විනිශ්චය මණ්ඩලයේ සැලකිල්ල යොමුවනු ඇත. විෂයයට හෝ විශේෂාංගයට ප්‍රස්තුත වන කාරණය ඡායාරූපයෙහි තරයේ විද්‍යාමාන විය යුතුය.
හැකි සෑම විටකම හැම ඡායාරූපයක් සමඟම ඊට අදාළ විස්තරය තිබිය යුතුය.
එක් එක් අයැදුම්පත සමඟ ඡායාරූප අවම වශයෙන් හයක් (6) ද උපරිම වශයෙන් දහයක් ද (10) ද ඉදිරිපත් කළ යුතුය.
තත්ත්වයෙන් බාල ඡායාරූප ඩිජිටල් උපක්‍රම මගින් වෙනස් කැරුණු ඡායාරූප හා සිරස්තල යොදා ඉදිරිපත් කැරෙන ඡායාරූප ද බාර ගනු නොලැබේ. සෑම ඡායාරූපයක්ම රාමු කොට ඉදිරිපත් කළ යුතුය.
ඡායාරූප පළවුණු මුල් පුවත්පත්වල අදාළ කොටස්, පළවුණු දිනද සහිතව ඉදිරිපත් කිරීම අවශ්‍යය.

### විශේෂ අවස්ථා යටතේ වාර්තා කිරීම වෙනුවෙන් පිරිනැමෙන කයිලාසපති සම්මානය

ස්වාධීන ශ්‍රී ලාංකික දමිළ නායකත්වයක් සඳහා සටන් කළ පුවත්පත් කලාවේදී විද්‍යාර්ථියකුට උපහාර වශයෙන් මෙම සම්මානය පිරිනැමේ. ස්වකීය පෞද්ගලික නිදහස මෙන්ම වෘත්තීය ස්වාධීනත්වය ද දැඩි තර්ජනයකට ලක්වන පමණක් නොව සිය ජීවිතය පවා අනතුරුදායක තත්ත්වයකට පත්වන අන්දමේ උග්‍ර පීඩාකාරී තත්ත්ව යටතේ ජනතාවට වඩා හොඳ තොරතුරු සැපයීමට වැඩ කරන පුවත්පත් කලාවේදියා හෝ පුවත්පත් කලාවේදීන් කණ්ඩායමක් වෙනුවෙන් මෙම සම්මානය වෙන් කැරෙයි. පීඩාකාරී අවස්ථා යටතේ කතාව ලියන ලද්දේ නම් ඒ බව පැහැදිලිවම ප්‍රකාශ කළ යුතුය.
මෙම ශ්‍රේණිය සඳහා උපකාරක ප්‍රකාශයක් විනිශ්චය මණ්ඩලයට අවශ්‍ය වන අතර, වාර්තා කරුවන් කණ්ඩායමක් විසින් අයැදුම් පතක් ඉදිරිපත් කැරෙන්නේ නම් ඒ සඳහා උපකාරක ප්‍රකාශයක් අදාළ කර්තෘවරයාගෙන් ලබාගත යුතුය.

පළවුණු ලිපි හැකි තරම් වැඩි ගණනක් (එහෙත් දහයට (10) වැඩි නොවන) අයැදුම්පතට උපකාර වශයෙන් ඉදිරිපත් කළ හැකියි කතුවරයකු විසින් හෝ පවුලේ සාමාජිකයකු විසින් හෝ අයැදුම්පතක් ඉදිරිපත් කැරෙන්නේ නම් අදාළ මාධ්‍යවේදියාගේ අභාවයෙන් පසුවද මෙම සම්මානය ඔහු වෙනුවෙන් පිරිනැමිය හැකිය.





### වසරේ ක්‍රීඩා මාධ්‍යවේදියා

ක්‍රීඩා දර්ශන නරඹමින් ඒ පිළිබඳ අව්‍යාජ හා විශ්වාසනීය තොරතුරු වාර්තා කිරීමෙන් එම වාර්තාකරණයට නව අගයක් එක් කළ හා ක්‍රීඩා පිළිබඳ විශේෂ දැනුමෙන් යුත් මාධ්‍යවේදියාට මෙම සම්මානය පිරිනැමේ ක්‍රීඩා එකක් හෝ කීපයක් පිළිබඳ වාර්තාකරණයෙහි යෙදෙන මාධ්‍යවේදීනට මේ සඳහා අයැදුම්පත් ඉදිරිපත් කළ හැකි අතර අනෙක් පුවත්පත්වලට කලින් පළවුණු වාර්තා පිටපත් වාර්තා හා/හෝ එම වාර්තා අනුසාරයෙන් පසුව ඇතිවුණු සම්මුඛ සාකච්ඡා පිටපත් ද අයැදුම්පත සමඟ ඉදිරිපත් කළ හැකිය.
අවම වශයෙන් පිටපත් හයක් (6) උපකාරක ප්‍රකාශ ද සමඟ ඉදිරිපත් කිරීම අවශ්‍යය.

### වසරේ කාටූන් ශිල්පී

ස්වකීය උපහාසාත්මක චිත්‍ර මගින් හෝ රටේ සැබෑ ස්වභාවය ප්‍රකට කිරීමේත් ජාතියේ යථා තත්ත්වය ගැන මත පළ කිරීමේත් හැකියාව ඇති චිත්‍ර ශිල්පියාට මෙම සම්මානය හිමි වෙයි. භාෂාමය බාධකය ඉක්මවා ගොස් පොදු ජන ප්‍රශ්න පිළිබඳ පොදු චින්තනය කලාව හා හාස්‍යය ඔස්සේ සිය කෘතියෙන් විදහා දැක්වූ කාටූන් චිත්‍ර ශිල්පියාට මෙම සම්මානය හිමිවෙයි. වසර ආවරණය කරන කාටූන් අවම වශයෙන් හයක් විනිශ්චය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම අවශ්‍යය. කාටූනයක් ලිපියක් සඳහා අඳින ලද්දක් නොවිය යුතුය.

### වසරේ අන් සැමට කලින් පළවුණු පුවතට හිමි සම්මානය

ජාතික වැදගත්කමින් යුත් කරුණු සහිතව වසරේ එකම සුවිශේෂී පුවත පළ කළ මාධ්‍යවේදියා හෝ මාධ්‍යවේදී කණ්ඩායම මෙම ශ්‍රේණියට අයත් වෙයි. වාර්තාවේ පිටපතක් උපකාරක ප්‍රකාශය සමඟ ඉදිරිපත් කළ මැනැවි. (මාධ්‍යවේදීන් කණ්ඩායමක් අයැදුම් කරන්නේ නම් උපකාරක ප්‍රකාශය කර්තෘවරයාගෙන් ලබාගැනීම අවශ්‍යය). මෙම ශ්‍රේණියේ වාර්තාවක් සුවිශේෂී විය යුතු අතරම එය අයැදුම්කරුවාගේ/අයැදුම්කරුවන්ගේ මුල් කෘතියද විය යුතුය.

### වසරේ ව්‍යාපාර හා මූල්‍ය මාධ්‍යවේදී (සිංහල/දෙමළ/ඉංග්‍රීසි)

සියලු පාඨකයන් තුළ උනන්දුවක් හා ඔවුන් කෙරෙහි බලපෑමක් ඇතිකළ ව්‍යාපාර තොරතුරු වාර්තාකරණයෙහි නිරන්තරයෙන් යෙදුණු ව්‍යාපාර මූල්‍ය හා ආර්ථික යන අංශ පිළිබඳ අවබෝධය වර්ධනය කළ, සිය වාර්තාකරණයේදී සාධාරණත්වය හා හොඳම පුවත්පත්කලාවේදී භාවිතයෙන් බැඳුණු පුවත්පත් කලාවේදියාට මෙම සම්මානය පිළිගැන්වෙයි.

තොරතුරු ආවරණය කිරීමටත් ප්‍රවණතා පිළිබඳ අනාවැකි පළ කිරීමටත් තොරතුරු විශ්ලේෂණය කිරීමට හා පොදු ප්‍රේක්ෂකයාට කරුණු පැහැදිලි කර දීමටත් අයැදුම්කරුවනට ඇති හැකියාව අනුව ඔවුහු විනිශ්චයට භාජනය කැරෙති. ආකර්ෂණීය